## සේරුවිල ප්‍රාදේශීය සභාව
## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 03 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 පෙබරවාරි 24 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

1.2 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව සේරුවිල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට සේරුවිල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

1.3.1 **ගණකාධිකරණ අඩුපාඩු.**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ප්‍රාදේශීය සභා පනතේ 172(2) ජේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනය සළසා නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් සඳහා මූල්‍ය ප්‍රකාශන තුළ ක්ෂය ප්‍රතිපාදන සළසා නොතිබුණි.

1.3.2 **ගෙවියයුතු ගිණුම්.**

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 කාලයක් ඉක්මවා තිබූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.693,576 ක් විය.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**පිළිතුරු නොලත් විගණන විමසුම්.**

2010 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 01 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.111,983 ක් විය.

1.3.4 **අනුකූල නොවීම්.**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධි විධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේ දි නිරීක්ෂණය විය.

| | | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව. | අනුකූල නොවීම. |
|---|---|---|---|
| (අ) | | 1989 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති. | |
| | (i) | 11 පරිච්ඡේදයේ 16(1) ඡේදය | චංචල හා නිශ්චල දේපළ වෙනුවෙන් ලේඛනයක් නඩත්තු කිරීමට ප්‍රාදේශීය සභාව කටයුතු කර නොතිබුණි. |
| | (ii) | 1 පරිච්ඡේදයේ 5(xi) ඡේදය | මුදල් හා ගබඩා සම්බන්ධයෙන් රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (iii) | 1 පරිච්ඡේදයේ 5(xii) ඡේදය | මුදල් හා ගබඩා භාර සිටින නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් ඇප තැන්පතුවක් ලබා ගෙන නොතිබුණි. |
| | (iv) | Xii පරිච්ඡේදයේ අංක 204 ඡේදය | සමීක්ෂණ මණ්ඩලය විසින් වර්ෂ අවසානයේ මුද්දර හා ලිපිද්‍රව්‍ය සමීක්ෂණය කර නොතිබුණි. |
| | (v) | Xii පරිච්ඡේදයේ 217 වන ඡේදය | ඉඩම් හා ගොඩනැගිලි සඳහා ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) | | <u>මුදල් රෙගුලාසි.</u> | |
| | (i) | මුදල් රෙගුලාසි 756 | 2010 වර්ෂය අවසානයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 1646 | වාහන ධාවන සටහන් විගණනයට භාර දී නොතිබුණි. |
| (ඇ) | (i) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත. | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තිය සහ 2006 ඔක්තෝබර් 12 දිනැති දේශීය ආදායම් කොමසාරිස්ගේ ලිපිය පරිදි කොන්ත්‍රාත් වැඩ සඳහා ගෙවීම්වලින් රු.8,044 ක් රඳවා ගැනීමේ බදු අඩු කර ගෙන නොතිබුණි. |

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.349,436 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මව ආදායම රු.234,092 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය.**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ හිටි ආදායම්.**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළබඳ තොරතුරු පහත දැක්වේ

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තු ගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇසතමේන්තු ගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 02 | 398 | 01 | 05 | 01 | 03 |
| (ii) | බදු කුළී | 1,505 | 1,634 | -- | 728 | 892 | -- |
| (iii) | බලපත්‍ර ගාස්තු | 205 | 137 | 67 | 155 | 159 | -- |
| (iv) | වෙනත් ආදායම් | 1,399 | 5,302 | -- | 10,508 | 6,908 | 3,600 |

2.2.2 **උසාවි දඩ මුදල්**

විවිධ ආඥා පනත් යටතේ සේරුවිල මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අය කර ප්‍රධාන ලේකම්/ පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.1,188,968 ක් වූ සභාවට ලැබියයුතු දඩ මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.2.3 **මුද්දර ගාස්තු.**

සමාලෝචිත වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අය වියයුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.3 **වියදම් ව්‍යුහය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 අයවැයගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 6,318,320 | 4,759,789 | 1,558,531 | 5,916,000 | 4,094,470 | 1,821,530 |
| අනෙකුත් | 2,642,320 | 1,964,988 | 677,332 | 5,980,000 | 3,632,500 | 2,347,500 |
| උප එකතුව | 8,960,640 | 6,724,777 | 2,235,863 | 11,896,000 | 7,726,970 | 4,169,030 |
| ප්‍රාග්ධන වියදම | -- | -- | -- | -- | -- | -- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 8,960,640 | 6,724,777 | 2,235,863 | 11,896,000 | 7,726,970 | 4,169,030 |
| මුළු එකතුව | ======== | ======== | ======= | ======== | ======= | ======= |

## 2.4 මානව සම්පත් කළමණාකරණය

### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | ඌනතාවය/ අතිරික්තය |
|---|---|---|---|
| මාණ්ඩලික | 01 | -- | 01 |
| ද්විතියික | 07 | 05 | 02 |
| ප්‍රාථමික | 13 | 10 | 03 |
| වෙනත් (අනියම්, තාවකාලික) | -- | 02 | (02) |
| එකතුව | 21 | 17 | 04 |

## 2.5 වත්කම් කළමනාකරණය.

### 2.5.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

වර්ෂ කීපයකට පෙර ඉදි කරන ලද රු.620,000 ක් වටිනාකමැති පොදු ළිං 12 ක් බලාපොරොත්තු වු අවශ්‍යතාවයට නොයොදා ගැනීම නිසා, නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

### 2.5.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.25,000 ක් විය.

### 2.5.3 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,949,805 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.1,934,805 ක් විය.

## 2.6 සමීක්ෂණය නොකළ වත්කම්.

භෞතික සමීක්ෂණ/ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවු 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.25,245,785 ක් විය.

## 2.7 අභ්‍යන්තර විගණනය.

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අයවැය පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ගබඩා

(ඉ) සේවක ණය

(ඊ) ආදායම් පරිලනය